ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව |
| දිනය | 2012.06.25 |

## ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම

ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය (LIBOR) සමග තරඟකාරී ලංසු තැබීම් තුලින් තීරණය වූ ආන්තික පොලී අනුපාතිකයන් සහිත එක්සත් ජනපද ඩොලර් මිලියන 150 ක ප්‍රමාණයක් වසර 3 ක බැඳුම්කරවලින් සුදුසුකම් ලද ආයෝජකයින්ට ඉදිරිපත් කරන ලදී.

මෙම නිකුතුව 2012 ජූනි මස 18 සිට 25 දක්වා විවෘතව තිබූ අතර 2012 ජූලි මස 02 වැනි දින ගෙවීම් කළ යුතු වේ. ශ්‍රී ලංකාව ඇතුළත ක්‍රියාත්මක දේශීය හා විදේශීය වාණිජ බැංකු වෙන්දේසිය සඳහා ලංසු ඉදිරිපත් කරනු ලැබිණි. ඉදිරිපත් කළ ප්‍රමාණය මෙන් 1.5 ගුණයක අධි දායකත්වයක් ලබා ගනිමින් එක්සත් ජනපද ඩොලර් මිලියන 229.02 ක ලංසු ලැබී තිබුණි. ආයෝජකයන්ගෙන් ලැබුණු ඉහළ ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් එක්සත් ජනපද ඩොලර් මිලියන 229.02 ක මුළු ප්‍රමාණයම වසර 3 කින් කල්පිරෙන බැඳුම්කරවලින් හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සහ වෙළෙඳපොල මගින් තීරණය වූ පොලී අනුපාතිකය වූ පාදකාංක 410 ක, බර තැබූ සාමාන්‍ය ආන්තිකයක් යටතේ පිළිගැනීමට රජය තීරණය කරන ලදී. අද දින එක්සත් ජනපද ඩොලර් සඳහා වන හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සියයට 0.73 ක් වේ.

මෙම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුව 1957 අංක 29 දරන විදේශ ණය පනතේ 2(අ) හා 2 (ඇ) වගන්ති යටතේ නිකුත් කෙරින.

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පිටසන් කර භාර දීමෙන් සහ එය ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී වෙත ලියාපදිංචි කිරීමෙන් පැවරීම සිදු කළ හැකිය. සුදුසුකම් ලත් ආයෝජකයින්ට ද්විතීයික වෙළෙඳපොලෙහි දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද බලයලත් නියෝජිතයින් මගින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගත හැකිය.